# කවි කොළය



## (මොබයිල්) හෑන්ඩ් ෆෝන් එක

ගිය සියවස තුළ 'ජහමනයගෙ' හිත
ඇදී ගියා අත් ඔර්ලෝසුව වෙත
අද නම් සෙල්පෝනය නොරැඳුණ අත
හිඟන පොරක්වත් හොයාගන්න නැත

ගඩොල් බාග වැනි සක්කර වටි ටන්
මුලින්ම ආ බඩු නැත ඔප මටි ටන්
ගිනි පෙට්ටියටත් වැඩියෙන් චුටි ටන්
බඩු පිට, බඩු එයි දැන් සුකුරුටි ටන්

පෙම්පත තෙත් කළ කඳුළින් දැසේ
වැටුණා කුණු කුඩෙට ඉති හාසේ
සිසු දරුවොත් සයිබර් අව කාසේ
අගාධයට ඇද වැටෙති විනාසේ

හෑන්ඩ් පෝනයෙන් අන්තර් ජාලය
කියවන තැනකට යොමුවිය කාලය
ඇතුළට අරගෙන ගොස් ඉස් කෝලය
දැරියක බිලිගති මේ ජං ජාලය

බිරින්දෑ සැමියගෙ නාහෙට තොණ් ඩුව
දාගෙන මේකෙන් කරයි ආණ් ඩුව
අරගෙන සෙල් එක නම් ලද හෙණ් ඩුව
කෙල්ලයි කොල්ලයි පාරෙත් රංඩුව

ඉස්සර හිටියා මිතුරන් පෑණේ
ලියුනුත් ලිව්වා ඉසකෙස් ගාණේ
මූණ දකින කොට මොබයිල් පෝනේ
ලියුම් ලියන්නට ඕනෑ නෑනේ

බැංකුව ගෙදරට ගෙන්නා ගන් නයි
ලෙඩෙට දොස්තර චැනල් කරන් නයි
කැමරාවෙන් වැඩ කිඩ පෙන්වන් නයි
පෑ විසිහතරෙම රිං රිං වෙන් නයි

හෑන්ඩ් පෝනයේ මත්කුඩු හංගා
සිසු දරු පිරිසක් සද්ද නො නංගා
ගියාලු පොලිසියෙ කණෙනුත් රිංගා
මේ මොළ සේදිය හැකිද සබන් ගා

පාතාලයො ටික මොළේ කොලොප් පන්
හිරගෙයි හිටියද වී වටලප් පන්
බූ වලූ අඬු පඬු එළියට පුප් පන්
පෝන් එකෙන් දෙයි සෙල්ලම කප් පන්

සෙල් එක ගෙන පෙම්
මුහුද කළම්බා
සිතෙන් බදාගෙන
ආදර 'ජම්බා'
රේල් පාරෙ
පැද්දෙන විට බිම්බා
දුම්රිය ඇවිදින්
තට්ටම සිම්බා



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**



## 'රත්මලී සහ පුංචි අපට දැන් තෙරේ' පැරිසියේ ළමා නාට්‍ය දැක්මක්

**මේ** නොබෝදා ප්‍රංශයේ පැරිස් අග නගරයේ වෙසෙන ශ්‍රීලාංකික දරු දැරියන්ගේ රඟපෑමේ කුසලතා දකින්නට පැරිසියේ අපට පින හිමිවිය. පූජ්‍ය කෝ. ආනන්ද හිමියන්ගේ අනුශාසකත්වයෙන් යුතුව පවත්වාගෙන යනු ලබන පැරිස් බෞද්ධ විහාරස්ථාන ඉරුදින දහම් සහ භාෂා පාසැලේ දරුදැරියන්ගේ සහ ඔවුන්ගේ දෙමාපියන්ගේ කැපවීම මෙම කර්තව්‍ය හි ලා මූලික වූ බව කිව යුතුය. එසේම එම දරුවන් පුහුණුකිරීමේ ලා මහත් දුෂ්කර කාර්‍යයක් ඉටු කළේ දැනට ප්‍රංශයට වීත් සිටින ශ්‍රීලංකාවේ ප්‍රකට ප්‍රවීන් නාට්‍ය ශිල්පිණිය සෝමලතා සුබසිංහ මහත්මියයි. "දරුවන්ට නිවැරදි වචන උච්චාරණයද, මනාව කවි හා ගීත ගායනාවට හුරුකරවීමද ඇය කළ එක් විස්මිත කාර්‍යයකි. මෙම නාට්‍ය දැක්ම නොමිළයේම පැවැත්වූ අතර එය නැරඹීමට සිංහළ දෙමළ ප්‍රංශ විශාල පිරිසක් පැමිණ සිටියෝය.

ප්‍රංශයේ ශ්‍රීලංකා තානාපති ලයනල් ප්‍රනාන්දු මහතා ප්‍රසංගය නිමාවේදී සහභාගි වූ දරු දැරියන්ගේ දක්ෂතාවන්ට ප්‍රසාදය පළකර අනතුරුව, මල් කළඹක් පිළිගන්වා නාට්‍ය ශිල්පිණිය පිළිගත් අතර, රැස්ව සිටි සියල්ලෝ ද එම කලාශූරියට චිරංජයතු යයි ආසිරි පැතුහ.

***සටහන - අමර ගුණසේකර***
***Photo - මෙරිල් කොඩිකාර***

## වකුගඩු සැත්කමට ලක්වූ මේ ළමයාට පිහිටවෙන්න!

**බේ**රුවල හලවගොඩ අංක **17** දරන නිවසේ පදිංචි කේ. පී. ඉරේෂ අසන්තා කුමාර ( **15** ) ළමයා දරුණු වකුගඩු රෝගයකින් වසර දෙකක් පමණ දැඩි සේ රෝගාතුරවී පසුගිය දා කොළඹ ජාතික රෝහලේදී වකුගඩු ශල්‍යකර්මයකට මුහුණ දුන්නේය. එම දරුවාට වකුගඩුවක් පරිත්‍යාග කරන ලද්දේ ඔහුගේ වැඩිමහල් සොහොයුරිය වූ රේණුකා මල්කාන්ති විසින්ය. දැනට දෙදෙනාම සුවෙන් පසුවන අතර රෝගීව සිටි කාලයේ විශාල මුදලක් වැයවී ඇති අතර, ඉඩකඩම් හා දේපළ විකුණා මේ දරුවා බේරාගැන්මට දෙමව්පියෝ කටයුතු කළහ. ඒ නිසාම මේ වන විට ඉති අසරණ තත්වයට පත්ව ඇති ඔවුන්ට දැනට වෛද්‍ය පරීක්ෂණ සහ සමහර බෙහෙත් වර්ග සඳහා විශාල මුදලක් දැරීමට සිදුවේ. ඉරේෂගේ පියා වන කේ. පී. කුමාරසේනට ස්ථිර රැකියාවක් නැති අතර ඔහු ත්‍රීරෝද රථයක් පදවන්නෙකි. වෛද්‍ය කටයුතු සඳහා වැයවන මුදලවත් සොයා ගැන්මට මාර්ගයක් නොමැති නිසා කිසියම් පරිත්‍යාගයක් කිරීමට කැමති පින්වතුන් සිටී නම් එය තම පුත්‍රයාට කරන විශාල උපකාරයක් බව පියා පවසයි.

ඒ වෙනුවෙන් බේරුවල ලංකා බැංකුවේ **2848416** සහ **2847074** යන ගිණුම් අංකවලට කැමති පින්වතුන්ගේ දායකත්වය ලබා දෙන ලෙස ඉල්ලා සිටී.

## වැලිකඩ හිරගෙදර යුද පිටියකට හැරේ

**වැ**ලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටින සිරකරුවන් අතර සිටින බොහෝ අපරාධකරුවන් හිරගෙදර තුළ මත්ද්‍රව්‍ය භාවිතය ද ඒවා අළෙවි කරන බවට ද එසේම ජංගම දුරකථන භාවිතා කරමින් සිරගෙදර තුළ සිට එළියේ දාමරික කම්, බැංකු මංකොල්ල කෑම් ආදිය මෙහෙයවන බවටත් ලැබුණු ආරංචි මාර්ග අනුව යමින් ගිය ඉරිදා **7** වනදා හදිසියේ සිරගෙදර පරීක්ෂකිරීමට ගිය පොලිස් කණ්ඩායම සමග ගැටුණු **2000** ක් පමණ හිරකරුවන් පොලීසියට පහරදී මහත් විනාසයක් සිදුකර ඇත. එදා පැය ගණනක්ම වැලිකඩ හිරගෙදර ගොඩනැගිලි තනිකරම යුද පිටියකට හැරුණු බව වාර්තා වෙයි එම ප්‍රහාරයෙන් පොලිස් නිලධාරීන් **46** දෙනෙක්



**තුවාලලත් පොලිස් නිලධාරින් 2 ක්**

තුවාල ලබා රෝහලට ඇතුළත් කර ඇති අතර ඉන් **16** දෙනෙකුගේ තත්වය ඉතා බරපතල බව කියති.

මෙම ප්‍රහාරය මැඩපැවැත්වීමට යුදහමුදා නිලධාරීන්ද ගෙන්වන්නට සිදුවීය. මෙම තත්වය ඇතිවීමට හේතුවක් වූයේ පොලිස් වැටලීමක් සිදුවන බවට හිරගෙදර නිලධාරීන් හිරකරුවන්ට කලින් දන්වා සිටි නිසායයි පොලීසිය දැන් සොයාගෙන තිබේ. ඇතැම් සිරකරුවන් පොලිස් නිලධාරීන් සිරකුටි තුළට ඇදගෙන ගොස් ඔවුන්ට පහරදෙමින් පිහියා වැනි තියුණු ආයුධ වලින් ඔවුන්ගේ සිරුරු කපා ඇති බවද කියති. මේ සියල්ල පිටුපස කුඩු නව්ෆර් සිටින බව බොහෝ අයගේ මතයයි.




**ඉරිදා**- **SUN** ලංකාවෙ අපේ නෑදැයිනගෙ පවා සමහර කරන කියන දේවල් පුදුමයි. ඔන්න හිටපු ගමන් හදිසියෙන් වගේ ඒ කවුරු හරි මෙහේ ලන්ඩන් වලට ටෙලිපෝන් කරනවා. ඒ ගෙදර කවුරු හරි වැටිලා කකුල කැඩිලා, එහෙම නැත්තන් උණයි හෙම්බිරිසාවයි හැදිලා, එහෙම නැත්නම් රෑ නිදාගනිද්දි ගෝණුස්සෙක් කාලා, ඔන්න ඔය වගේ දේවල් අපිට කියන්න. පාන්දර දෙකට තුනට තුන් නින්දේ ඉන්න කොට ටෙලිපෝන් කරනවා, අපි ගැස්සිලා ඇහැ ඇරෙනවා. වෙලාව ගැන හිතන්නෙ නැහැ. ඇහුවම ඉතින් වෙදෙක්, දොස්තර කෙනෙක් ගාවට ගෙනිච්චෙ නැද්ද කියලා, නැතිලු. ඒහැම දේටම ඉස්සරවෙලා අපිට කියන එක ඒ ගොල්ලන්ගෙ යුතුකමක් ලු. ඊට පස්සෙලු ලෙඩා අරන් යන්නෙ පෙන්නන්න.

**සඳුදා**- **MON** හිරගේ ඇතුළෙ හෙරොයින් බිස්නස් එක යන බවට ලැබුණු ඔත්තුවකට අද උදේ වැලිකඩ හිරගෙදරට ගිය පොලීසියට හිරකාරයො එකතුවෙල් අල්ලගෙන හොඳටම ගහලා. බරපතල විදියට තුවාලකරලා. පොලීසියෙ 43 ක් ඉස්පිරාතාලෙ. ඒකට උදව්කරලා තියෙන්නෙ බලන් යන කොට ජේලර්ලා කීප දෙනෙක්. උන් ඇතින් ඉඳගෙන හිරකාරයින්ට සිග්නල් දෙනවා දැකලා තියනවා. වහපු හිරකූඩු ඇරගෙන එළියට එන්න ඒවා ඇරලා දුන්නෙ කවුද ජේලර්ලා මිසක්. අඹේපිටිය නඩුකාරයා මරපු මිනීමරුවා, කුඩු නවුෆර් ඉන්නෙත් ඔය හිරගෙයි මයි. මෑන් මේ පහරදීමෙ නායකයා බව කියනවා. සමහර ගාඩ්ලා ජේලර්ලා නවුෆර්ගෙ තද යාළුවො බව කවුරුත් දන්නව. ඉතින් ලංකාව දූෂණයෙන් බේරන්නෙ කොහොමද?

**කුජදා** - **TUE** දේශපාලනයට බහින අයට දේශපාලනේ උගන්වන්න දේශපාලන ඇකඩමියක් කොළඹ දාන්න යන බව මෛත්‍රීපාල සිරිසේන ඇමතිවරයා ළඟදි රැස්වීමකදී එළිකරලා තිබුණා. ඒක හොඳ වැඩක්. ඒකට මුලින්ම බන්දගන්නෙ ලංකාවෙ දැන් ඉන්න මැති ඇමතිවරු ඇතුළු ප්‍රාදේශීය මන්ත්‍රීවරුත් බවත් කිව්වා. ඒක තවත් හොඳයි. මොකද දේශපාලනය උගන්වන්න ඕන ජනතාවට වඩා මැති ඇමතිවරුන්ටයි. උන් තමයි දේශපාලනයක් දන්නෙම නැති උදවිය. මර්වින් සිල්වා වගේ අය මොන ඇකඩමියෙ දැම්මත් වැඩක් නෑ, හදන්න බෑ. මෑන්ගෙ දේශපාලනේ තමයි ඕනම කෙනෙකුට කුණුහරුපෙන් බනින එකයි, මිනිස්සු ගස්වල බැඳීමයි.

**බුදදා**- **WED** බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන් මේ ළඟදි ඉල්ලා සිටියා පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු කැන්ටිමෙන් කනබොන කොට ඒවට ගෙවන්න කියලා. ඒක ආර්ථික ප්‍රපාතයෙන් ගොඩ එන්න යම් ප්‍රමාණයකට රුකුලක් වේවි කියලත් ඔහු කිව්වා. නමුත් ලංකාවෙ පාර්ලිමේන්තුවෙ මන්ත්‍රී කෙනෙකුට මස්, මාලු, බිත්තර, එළවළු, කිරි පැණි, වටලප්පන්, පෘට්සැලඩ් ඔය සේරම දීලා අයකරලා තියෙන්නෙ රුපියල් පහයි. මේළඟදී ඒක රුපියල් 35 කළයි කියලා මැති ඇමතිවරු කෑගහලා තිබුණා. රුපියල් පහට දැන් ලංකාවෙ කෙහෙල් ගෙඩියක්වත් කන්න බෑ. එළියෙ කඩේක බත් පාර්සලයක් රුපියල් 80 ක් වෙනවා. හරිම අසාධාරණයි. සමහර දේශපාලකයන්ගෙ වැඩ දැක්කම උන් නඩත්තු කරන්න යන හැම සතයක්ම මහා අපරාධයක් කියලා හිතෙනවා.

**ගුරුදා** - **THU** අද පැරිස්වල ලොකුනංගිට කතාකෙරුවා. අක්කෙ අපි හරි බයෙන් ඉන්නෙ කිව්වා. මං ඇහුවා ඇයි කියලා. බලනකොට එයා විතරක් නෙවෙයි මුළු ප්‍රංශෙම බයවෙලා ඉන්නෙ. ළඟදි ප්‍රංශ රජය මුස්ලිම් ගෑණුන්ට මූණ වහගෙන යෑම තහනම් කළා. බින් ලාඩන් කියලා තියනවා ප්‍රංශෙට ළඟදිම ඒවට වන්දි ගෙවන්න වේවි කියලා. ඇමරිකාවට ගැහුවවගේ ප්‍රහාරයක් දේවි කියලා මුළු ප්‍රංශෙම දැන් ගූ බයෙන් ඉන්නෙ.

**කිවිදා** - **FRI** ලංකාවෙ ගෙවල් හදලා ඒවා කුළියට දීලා ලන්ඩන් ඇවිත් ඉන්න හුඟ දෙනෙක් දැන් බයෙන් ඉන්නෙ. ඒව හදපු මෝඩකම් කියලා දැන් හිතනවා. රන්ජනීලගෙ හෝමගම හදාපු ගේ ආපහු ගන්න බැරුව ඉන්නෙ. ඉන්න ඇයො දැන් යන්නෙ නෑ. ගෙදරින් යන්න ලක්ෂ හැටක් ඉල්ලනවලු. පුළුවන් නම් නඩු කියලා ගන්න කියනවලු. දැන් නඩුවක් දාලා. තියන සල්ලි ඔක්කොම පෙරකදෝරුවන්ට. ජීවිතේ අන්තිම කාලෙ ලංකාවට ගිහිං නිවී සැනසිල්ලෙ ඉන්න හිතාගෙන ගෙයක් හදවපු රන්ජනී. අනේ දැන් හරිම හිතේ කණගාටුවෙන් ඉන්නෙ.

**ශනිදා** - **SAT** දැන් ලංකාවෙ දේශපාලනේට බැහැපු අයගෙ අළුත්ම මෝස්තරේ තමයි සිංදු කියන එක. මේළඟදි මෙගා ස්ටාර් තෝරන තරඟයක් ඉවර වුණේ බෝතල් වලින්, ගල්වලින්, පුටුවලින් ගහගෙන. ජනතාවට සේවය කරන්න කියලා එන දේශපාලකයා මෙන්න ස්ටේජ් වල නැගලා සිංදු කියනවා. මේ සිරිත ලෝකෙ කොහේවත් නැති දෙයක්. සිංගප්පූරුව මැලේසියාව වගේ රටවල් දියුණු වුණේ දේශපාලකයො මැරීගෙන වැඩ කරලා. සිංදු කියලා නටලා නෙවෙයි. ලංකාවෙ ඡන්ද දායකයන්ටත් හරි කෙනෙක් පත්කරගන්න තමන්ගෙ ඡන්දය පාවිච්චි කරන්න මොළයක් කියලා දෙයක් නෑ. අපේ රට කටහඬට හිනාවට රූපෙට රැවටෙන රටක්.